සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

(15)

| මගේ අංකය / எனது இல / My No. | MF/BB/O2./Notice(Dso,Div.Sec./1 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2022.11.17 |
|---|---|---|---|---|---|

උපදෙස් ලිපි :07

දිස්ත්‍රික් ලේකම්වරු මගින්,

ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම -2022</u>

2022 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන අනුව උක්ත කරුණට අදාලව මුළු දිවයිනම ආවරණය වන පරිදි 2022 වර්ෂයට අදාලව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම සඳහා මූලික දත්ත ඇතුලත් කිරීම මේ වන ක්‍රියාත්මක වේ.

02. ඒ අනුව එම මූලික දත්ත ඇතුලත් කිරීම සඳහා ලබා දී ඇති කාලය 2022.11.30 දිනෙන් අවසන් වන අතර තොරතුරු පද්ධතියට අදාල මූලික දත්ත ඇතුලත් කිරීමේදී ඇති වූ දෝෂ ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ නිවැරදි කිරීම සඳහා 2022.11.17 දින සිට එනම් අද දින සිට එම පද්ධතිය මගින් පහසුකම (EDIT OPTION) සපයා ඇත.

03. ඒ අනුව පද්ධතියට ඇතුලත් කරනු ලැබූ අයදුම්පත් හි දෝෂ නිවැරදි කිරීමේ ක්‍රියාවලිය ද 2022.11.30 දින අවසන් වියයුතු බව කාරුණිකව දන්වමි.

04. තවද පද්ධතියට ඇතුලත් කරන ලද අයදුම්පත්‍ර දෝෂ නිවැරදි කිරීමේදී අනුගමනය කළයුතු මාර්ගෝපදේශය මේ සමඟ ඇමුණුම I ලෙස අමුණා ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන නිරන්තර සහයෝගය ඉතා අගය කොට සළකමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්

o/c

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk

## දැනට ඇතුළත් කර ඇති දත්ත වල පවතින දෝෂ නිවැරදි කිරීම

## සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීමට සුදුසු තැනැත්තන් /පවුල් හඳුනා ගැනීම - 2022


සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම සඳහා ජනතාවගෙන් කැඳවන ලද අයදුම්පත් දැනටමත් පද්ධතියට ඇතුළත් කර ඇත. ඒ අනුව එම දත්ත ඇතුළත් කිරීමේදී සිදුවූ දෝෂ නිවැරදි කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට ඉල්ලීම් කර ඇත. ඒ අනුව දත්ත පද්ධතිය තුළ එම දෝෂ නිවැරදි කිරීමේ ක්‍රමවේදය පහත විස්තර කෙරේ.

- දත්ත වල සුරක්ෂිත භාවය සනාත කිරීම සඳහා පද්ධතිය තුළ මෙම දෝෂ නිවැරදි කිරීම සිදු කිරීමට පහසුකම් සලසා ඇත්තේ සහ අවසර ලබාදී ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ ගිණුම හරහා පමණි.
- ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරන ලද හෝ ඔහුගේ/ඇයගේ දැනුවත් කිරීම මත මෙම ක්‍රියාවලිය සිදුකළ යුත්තේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිටින එක් නිලධාරියෙකු හරහා පමණි.


### පද්ධතියට ඇතුලු වීම සහ අවශ්‍ය රාමුව (Dashboard) ලබා ගැනීම

01. පළමුව wbb දත්ත පද්ධතියට ඇතුලු වීමෙන් (log in )අනතුරුව පහත පෙන්නුම් කරන පළමු රාමුව වෙත පිවිසිය යුතුවේ.

පළමු රාමුව



02- පළමු_රාමුවේ සඳහන් "Corrections" අයිතමය Click කරන්න.





එවිට දෙවන රාමුව දිස්වේ.

## <u>03. දෙවන රාමුව</u>


එම දෙවන රාමුවේ අයිතම 2ක් දිස්වේ.

01. View Suspicious
02. Edit Application




## 04. අයදුම්පත් වල නිවැරදිතාවය තහවුරු කිරීම - View Suspicious

දෙවන රාමුවේ සඳහන් "View Suspicious" click කිරීමෙන් සමාන ලක්ෂණ ඇතැයි සිතිය හැකි (Duplicate) අයදුම්පත් ලයිස්තුව දිස්වේ. එම සමානකම් අතර එකම හැදුනුම්පත් අංකය ඇති අයදුම්පත් උදාහරණ සේ දැක්විය හැකිය. (වගුවේ NIC අංකය බලන්න )




05. මෙම අයදුම්පත් පරික්ෂා කිරීමෙන් අනතුරුව සමානතා ඇති (Duplicate )අයදුම්පත් ලෙස තීරණය කරන්නේ නම් එම අයදුම්පත දත්ත පද්ධතියෙන් ඉවත් කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයාට හැකියාව ඇත.


අයදුම්පත ඉවත් කිරීම සඳහා Duplicate අයදුම්පත ඉදිරියේ ඇති  බොත්තම click කරන්න.



06.සියලුම අයදුම්පත් වල ඇති දෝෂ සකස් කිරීම - Edit Application

දෙවන රාමුවේ සඳහන් “Edit Application” අයිතමය click කරන්න.

එවිට අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්පත්වල ලයිස්තුවක් මෙම රාමුවේ දිස්වේ.




07.එම අයදුම්පත්වල දෝෂ සහ අඩු පාඩු ඇතිනම් එවා නැවත නිවැරදි කිරීම (Edit) මෙම රාමුව තුළ සිදු කළහැක. එම අඩුපාඩු සකස් කිරීමෙන් පසු අයදුම්පතේ ඉදිරියෙන් පෙන්නුම් කරන “save” බොත්තම click කිරීමෙන් අයදුම්පත save සිදුකළ යුතුවේ.

